# ශ්‍රී ලංකාවේ හීලෑ අලි ඇතුන් සම්බන්ධ චාරිත්‍ර - වාරිත්‍ර

**තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස් ***

වසර 2500 කට අධික ලිඛිත ඉතිහාසයක් හා ඊට බොහෝ පැරණි ජනප්‍රවාද ගත ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකාව ඉපැරණි සංස්කෘතියක් හිමි රටක් ලෙස සැලකිය හැකිය. ආසියාවේ බොහොමයක් පැරණි රටවල්වල මෙන්ම ශ්‍රී ලංකාවෙහිද දියුණු හා ඉපැරණි සංස්කෘතියකට අනුව හැඩගැසී ඇත. පැරණි රජ දවසටත් පෙර යුගයේ සිටම පැවත ආ මෙම දේශීය සංස්කෘතිය කලින් කලට පැවති සමාජ තත්ත්වයන් අනුව විවිධ වෙනස්වීම්වලට හා හැඩගැසීම්වලට ලක්වෙමින් ගතික සමාජ තත්ත්වයන්ට ඔරොත්තු දෙන පරිදි සකස් වී ඇත. ඕනෑම සංස්කෘතියක ප්‍රධානතම ලක්ෂණයක් ලෙස චාරිත්‍ර වාරිත්‍ර නැතහොත් සිරිත් විරිත් දැක්විය හැකිය. චාරිත්‍ර වාරිත්‍ර ඕනෑම සංස්කෘතියක් සජීවීකරණය කරනු ලබයි. සංස්කෘතියකට හිමිකම් කී මිනිසුන් වශයෙන් අප සමාජය තමන්ට වැදගත් තම සිත් බැඳි යම් වස්තුවක් හෝ කාර්යයක් වී ද එය වටා එයටම අනන්‍ය වූ කුඩා සංස්කෘතියක් නිර්මාණය කළේය. මෙය මහා සමාජය තුළ උප සංස්කෘතියක් වශයෙන් පැවතිණි. මෙම උප සංස්කෘතීන් තුළ ද ඒවාට ම අනන්‍ය වූ චාරිත්‍ර වාරිත්‍ර පැවතුණි. අලි ඇතුන් රජ දවසට පෙර යුගයේ සිටම ලාංකීය මිනිසාට සමීපව සිටි බව සමහර ජනප්‍රවාද ගත තොරතුරු අනුව පැහැදිලි වේ. ඒ අනුව රජ දවස පටන්ම අලි ඇතුන් අප සමාජයේ වැදගත් අංගයක් විය. මේ හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ හීලෑ අලි ඇතුන් කේන්ද්‍ර කර ගනිමින් උප සංස්කෘතියක් නිර්මාණය විය. අලි ඇතුන් ඇල්ලීම, හීලෑ කිරීමේ සිට ඔවුන්ගේ මරණය දක්වාම එක් එක් කාර්යය සඳහා නිශ්චිත වූ ක්‍රියාපටිපාටියක් නිර්මාණය කෙරිණි. ඕනෑම සංස්කෘතියක ප්‍රධාන ලක්ෂණයක් වූ චාරිත්‍ර වාරිත්‍ර මෙම උප සංස්කෘතිය තුළ ද වේ. හස්තියාට ත්‍රිවිධ රත්නයේ හා දෙවියන්ගේ ආශිර්වාදය හා ආරක්ෂාව ලබාගැනීම, මිනිසුන් තුළ හස්තියා කෙරෙහි ගෞරවය හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම, තම කර්තව්‍යයන් සඳහා දායක වන සත්ත්වයාට කෘතගුණ දැක්වීම, හස්තියා - අලි හිමියා, හස්තියා - ඇත්ගොව්වා අතර ඇති බැඳීම තීව්‍ර කිරීම ආදිය මෙම චාරිත්‍ර - වාරිත්‍ර ඉටු කිරීමේ ඍජු හා වක්‍ර අරමුණු බවට පත්ව ඇත.

ඇත්වාහනය (පිටේ වාඩිවෙන තැන) වෙනම දේවතාවන් සිටිනවා යැයි ඉපැරණි විශ්වාසයයි. ඒ දෙවියන්ට පිටතට වැඩම කරවන්ට ආරාධනා කොට වතපුටුව තැබීමේ චාරිත්‍රය සිදුකරනු ලබයි. ඉන්පසු ප්‍රථමවරට කරඬුව හෝ දේවාභරණ වැඩම කරවන්නට සූදානම් වන හස්තියෙකුට තෙරුවන්ගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කොට දෙවියන්ට භාරභාරවීම සිදුකරයි. ඊට අමතරව ස්වාමින් වහන්සේලා වැඩමවා සෙත් පිරිත් සජ්ජායනා කර ආශිර්වාද කොට කැවුම් කෙසෙල් කිරිබත් සකසා සිංහල සම්ප්‍රදායික ක්‍රම අනුව හස්තියාට සංග්‍රහ කිරීම සිදුකෙරේ. හස්තියාගේ පිට කහදියරෙන්

* තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස්
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, පුරා විද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය.

නහවා වතපුටුව හිඳුවා රන්සිවිගෙය තැන්පත්කොට කරඬුව වැඩමකරවීම සිදුකරයි. මෙවැනි අවස්ථාවන් අලි ඇතුන් මෙන්ම පාරම්පරික අලි හාම්පුතුන් සිය ජීවිතයේ ලබන සුවිශේෂී අවස්ථාවකි. අලි හාම්පුතුන් නිවසේ අප්‍රේල් මාසයේ සිංහල අලුත් අවුරුදු චාරිත්‍රවල හිසතෙල් ගෑමේ චාරිත්‍රය අලි ඇතුන්ට දීර්ඝායුෂ පතා අනිවාර්යයෙන්ම සිදුකරනු ලබයි.

ඒ වගේම දළ ඇතුන් සහ පිරිමි සතුන් වසරකට වරක් සිදුවෙන මද කිපීමේ කටයුත්තේදී එලෙස මද කිපුණු අලියා ගස් බැඳීම සිදුකරනු ලබයි. මාස කිහිපයකට පසු අලියාගේ ඉරියව් සංසුන් වී මද ගැලීම නැවතුණු පසු අලියා ගහේන් ලෙහීම සිදු කරයි. මෙදින ද අලි ඇතුන් සම්බන්ධ විශේෂ චාරිත්‍ර වාරිත්‍ර කිහිපයක් ඉටුකරනු ලබයි. ඇතා හෝ අලියා ගහෙන් ලෙහන දින දෙවියන් බුදුන්ට පහන් පත්තු කර ආශිර්වාද ලබාගෙන පළමුව හස්තියා ළඟට යන ඇත්ගොව්වා විසින් දෙවතා බැස්ම නම් චාරිත්‍රය ඉටු කරනු ලබයි. පිරිත් කියා පිරිත් පැන් ඉස මේ කටයුතු ආරම්භ කරන බවයි අලි හිමියන් පවසන්නේ. පසුව අලියා නිදිකරවා ගාථා පද කියා හස්තියාගේ පිට උඩ වැඩ සිටින දෙවියන්ට වෙනත් ස්ථානයකට වඩින ලෙස ආරාධනා කරයි. මෙලෙස කිරීමට හේතුව ඕනෑම හස්තියෙකුගේ පිට උඩ දින හතක කාලයක් මිනිසෙකු නැග්ගේ නැත්නම් ඒ ඇතාගේ පිට උඩට දෙවියන් වඩින බවට විශ්වාසයක් පැවතීමයි.

ගාථා පද කීම පිළිබඳව බැලුවහොත් ඇත්ගොව්වා හෙණ්ඩුව භාර ගැනීමේ තැන සිට පැවසිය යුතු ගාථාවන් පැරැණ්නන් අතර පවතී. හීලෑ කිරීම සඳහා වන අලි ඇල්ලීමේ සිට විශාල චාරිත්‍ර වාරිත්‍ර ප්‍රමාණයක් සිදුකරන බව පෙනෙන්නට තිබේ. වන අලි මදුගසා ඇල්ලීමට යාමේදී  ඒ ඒ ප්‍රදේශ භාර දෙවියන්ට භාරහාර වීම හා කන්නලව් කිරීම ද සිදුකෙරේ. ඊට අමතරව ඒ කටයුතු සිදුකරන පුද්ගලයන්ගේ ආරක්ෂාව පතා කොළ අතු කඩා එල්ලා පොල් ගසා වනයට ඇතුල්වීම සිදුකරනු ලැබූ බව ඉතිහාසයේ සඳහන් වේ. මෙලෙස අල්ලාගන්නා ලද හස්තියෙකු අලි හිමියාගේ නිවස වෙත රැගෙන එන ප්‍රථම දින එම නිවස උත්සවශ්‍රීයෙන් සූදානම් කෙරේ. තම අලි පංතියට (අලිගාලට) තවත් අලියෙකු එකතු වුණා යන හැඟීමට එහා ගිය තම පවුලට අලුත් සාමාජිකයෙකු සම්බන්ධවුණා යන හැඟීමෙන් කටයුතු කරනු ලබයි. එදින කැවුම් කිරිබත් ආදී සංග්‍රහ අලියාට ලබාදීම සිදු කරයි. ඒ වගේම ඒ ඒ ප්‍රදේශ භාර දෙවියන්ට භාරහාර කරනු ලබයි. කෑගල්ල ප්‍රදේශයේ එනම් සතර කෝරලයේ අලි හිමියෝ සිය හස්තීන්ව ප්‍රදේශ භාර දෙවියන් ලෙස සැලකෙන අලුත්නුවර දැඩිමුණ්ඩ දෙවියන් වෙත භාරකරනු ලබති. එම ප්‍රදේශවල පාරම්පරික අලි හිමියන් පවසන පරිදි වන අලියා කිසිදු අපල උපද්‍රවයක් සිදු නොවී හීලෑකරගැනීමටත් එසේ කටයුතු සිදු වූ පසු පළමුව අලුත්නුවර පෙරහැර මංගල්‍යයට සහභාගීකරන බවටත් භාරහාර වේ. මෙලෙස රත්නපුර ප්‍රදේශවල අලි හාම්පුතුන් සබරගමු සමන් දේවාලයට භාරහාර වීම සිදුකරන බවට තොරතුරු හමුවේ.

අලි හාම්පුතුන් සිය අලි ඇතුන් දුරබැහැර පෙරහැර සඳහා පිටත් කර හරින විට ද විවිධ චාරිත්‍ර වාරිත්‍ර සිදුකරන බව පෙනෙන්නට තිබේ. පිටත්වන හස්තියාට බෞද්ධ ආගමික වතාවන්ට අනුකූලව පිරිත් සජ්ජායනය කොට පිරිත් පැන් ඉස ආශිර්වාද පිරිත් හා මල් පැලක් (ගොක් කොල නිර්මාණ) සකසා තුනුරුවනට හා දෙවියන්ට පහන් පත්තු කර ආශිර්වාද ප්‍රාර්ථනා කරයි. පෙරහැර සඳහා සහභාගී වී නැවත පැමිණෙන තෙක් හස්තියාට මෙන් ඇත්ගොව්වාට, ගෝලයාට කිසිදු කරදරයක් නොවේවා යී ආරක්ෂාව ප්‍රාර්ථනා කරයි.

පළමුව සධාතුක කරඬුවක් වැඩම කරවීම හෝ දේවාභරණ වැඩම වීම සිදුකරන හස්තියෙකුට ඊට සූදානම් කරනු පිණිස වතපුටුව තැබීමේ චාරිත්‍රය නම් චාරිත්‍රය ඉටු කරනු ලැබේ. පිරිමි සතුන් හා කටයුතු කරන ඇත්ගොව්වන් මස් මාළු කෑමෙන් සහ කිල්ලට හසුවීමෙන් බොහෝම ප්‍රවේශම් වන බව පැවසේ. විශේෂයෙන්ම මළ ගෙදරකට සහභාගීවන ඇත්ගොව්වන් දින කිහිපයක් යනතුරු හස්තියාගෙන් ඈත් වී සිටීමට වගබලාගනු ලබයි. ඒ බොහෝ අලින් කිලි කුණු දැඩිව ප්‍රතික්ෂේප කරන නිසාවෙනි.

ඒ වගේම අලියාට මංගර කුමාර යැයි පැවසෙන දිෂ්ටියක් පවතින බවත් ඒ දිෂ්ටියට හත් දෙනෙකු සිටින බවත් ඒ හත් දෙනාට වරදක් නොවන ලෙස ඇත් ගොව්වා සිටිය යුතු බවත් පැරැණ්නෝ දැඩිව විශ්වාස කළහ. මේ සියලු චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීමේ දී දෙවියෙන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇති බව පෙනෙන්නට තිබේ. ඒ හස්තියා යනු දෙවියන්ටම කැපවුණ සත්වයෙකු නිසා වන්නට පුළුවන.

හීලෑ අලියෙකු මිය යාම ද ප්‍රභූ පුද්ගලයෙකුගේ මරණයක් හා සමානව අවසන් කටයුතු සිදුකිරීමට අලි හිමියෝ පියවර ගනිති. ස්වාමින් වහන්සේලා වැඩමවා පාංශුකූලය ලබාදීම ආදිය සිදු කරනු ලබයි. ඒ කෙසේ වුවද අලි ඇතුන් ජීවත්ව සිටියදී මරණගෙවල් අසලට නොගෙන යාමට ඇත්ගොව්වන් වගබලාගනී.

අද වන විට හීලෑ අලි ඇතුන් හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර බොහෝමයක් සැඟව පැවතුණ ද, පරිණත ඇත්ගොව්වන් සහ පාරම්පරික අලි හාම්පුතුන් ඒවා නොකඩවා ඉටු කිරීමට පියවර ගනී.

**මූලාශ්‍ර පුද්ගලයෝ**

- දේශීය වෛද්‍ය හර්ෂ ධර්මවිජය මහතා
- එස්.ආර්.ඒ.මිල්ලන්ගොඩ මහතා
- සබරගමු පළාත් පළාත් සභා මන්ත්‍රී ආනන්ද මිල්ලන්ගොඩ මහතා
- දේශීය හස්ති වෛද්‍යාචාර්යය, දළදා මාලිගාවේ ඇත් පන්ති භාරකරු ප්‍රදීප් මියනපලාව මහතා
- හීලෑ අලි ඇතුන්ගේ සංගමයේ ලේකම් ධම්සිරි බණ්ඩාර කරුණාරත්න මහතා